**විමංශනය**

# ජනතාවට හිමිවිය යුතු තාක්ෂණය

**ලෝකයේ ප්‍රකට සංවර්ධන සංනිවේදකයෙකු හා සංවර්ධන විශේෂඥයෙකු වන අන්ද්‍රයාස් පග්ලෙසාන්ගේ සුප්‍රකට ග්‍රන්ථයක් වන එකට එකතු වී කටයුතු කිරීම: උචිත තාක්ෂණයේ සංනිවේදන අත්දැකීම් පිළිබඳ වාර්තාවෙන් උධෘතයන් මෙහි පළවේ. ස්වීඩනයේ ඩැග් හැමර්ෂල් පදනමේ එම ප්‍රකාශනයෙන් ගුණරත්න රාමනායක විසින් කරන ලද මෙම පරිවර්තනයෙන් උචිත තාක්ෂණයේ තවත් වැදගත් පැත්තක් අනාවරණය වෙයි.**

**ව**ර්ෂ දහස් ගණනක් තිස්සේ ලෝක ජනතාව අත්පත් කරගෙන සිටි තත්වය වන ස්වශක්තියෙන් පරිපූර්ණ වීමේ අනභිකම වර්ණනා කිරීම අපහසු කටයුත්තක සේ නොපෙනී යා හැකිය. එහෙත් එය එසේය. අප හඳුන්වා දීමට බලාපොරොත්තු වන විවිධාකාරයේ උචිත තාක්ෂණයන්ගේ ස්වභාවය කුමක්ද? ඒවා සියල්ලම සාධක කරගත් අදහස වන්නේ 'ශ්‍රමය' ඉතා පහසුවෙන් ලබාගත හැකි සම්පත යන අදහසයි. එහෙයින්, ඉතා විශාල කාල පරිච්ඡේදයක් තුළදී ශ්‍රමය ක්‍රමිකව ලබාගත නොහැකි, ප්‍රති නිෂ්පාදන ශක්තිය වෙනස්වන හා සම්පතක් යන අදහස අමතක කරති. නව තාක්ෂණය මගින් ජනතාවගේ නව ජීවන රටාවක් සකස් කර ඇත.

ජනතාවගේ ජීවන රටාව හා තාක්ෂණය එක්ව ගමන් කරන්නේ කෙසේද ? ජනතාවගේ වැඩකරන ක්‍රමයේ ස්වභාවය කුමක්ද ?

ගමේ තාක්ෂණය පිළිබඳව ජිම් ටේලර් මෙසේ කියන්නේය:''කැපී පෙනෙන ගති ලක්ෂණ කීපයක් එහි ඇත්තේය. එකක් නම් රට මුලුල්ලේම භාවිතාවන තාක්ෂණයේ බහුල භාවය හා විවිධ භාවයයි. දෙවැන්න අසල පරිසරයෙන් ලබාගත් දේශීය ද්‍රව්‍ය උපයෝගී කරගැනීමයි. තුන්වැන්න පරිසරය සමඟ එම තාක්ෂණයේ ඇති සමතුලිත භාවයයි. කිසිවක් විනාශ නොවේ. රඳවා ගැනීම පහසුය. පිටින් ලබා ගන්නේ ඉතා සුළුවෙනි. සියල්ල සියතින්ම නිෂ්පාදනය කර ඇත. අවසාන වශයෙන්, ඒවා සියල්ලෙහිම, ජනතාවගේ ප්‍රිය ජනක තාක්ෂණික ලක්ෂණ පිළිබිඹුවේ. සැබවින්ම මේ ගමේ තාක්ෂණය යැයි කිවහැකිය. ඒවායින් බොහොමයක ගමේ පවුලේ වැඩකටයුතු වර්ධනය කිරීමට උපකාරවන්නේ මෙසේ යැයි පෙනේ. ගොවිපොලෙන් යමක් කඩා ගැනීම, කඩෙන් මිල අධික ආහාරයක් ගෙනෙනවාට වඩා ආනන්ද ජනකය.''

**මානසික ස්වභාවය කුමක්ද ? මෙහි තරඟකාරිත්වය මත ඉහළින් සළකන එය පෞද්ගලික දක්ෂතාවයක්ද? නැතහොත් එය ජනතාවගේ සාමූහිකව කටයුතු කිරීමේ ප්‍රතිඵලයක්ද? ශ්‍රීමත් මඕරි කිකි එයදකින්නේ මෙලෙසයි:** '' මා බාලකාලයේදී ජනතාව සියල්ල කළේ සාමූහිකවයි. ගමේ සියලු කටයුතු බලාගන්නා කරිකාරා කිවා හායිලා නම් නායක මත ඔවුහු විශ්වාසය තබා සිටියහ. නායකයා තෝරා පත්කරගත් අයෙකු නොවූ නමුත් දක්ෂ අයෙකු බව ඔප්පු කර තිබිණි. ''අද අපි බිම් කෙටීමට යමුයි.'' ඔහු කියූවිට අපි සියලු දෙනාම ගොස් බිම් කෙටුවෙමු''.

එසේ නම් එය නායකත්වයේ ලක්ෂණයක්ද ? සිය ක්‍රියාකාරිත්වය මගින්ම සම්ප්‍රදායික නායකත්වය ජනතාවට දුන්නේද? නව නායකත්වය රජය වෙනුවෙන් ගමට උපදෙස් දෙන හා සංවිධාන කරන කොටසක්ද? මෝඩි ආවෙෂි මෙලෙස පවසයි: ''පරාධීනවීමට පෙර, එයට පෙර පැවතියාක් මෙන් ගම ''ජීවන මාර්ගය'' විය. එනම්, ඔවුන්ගේ වැඩ කිරීමේ, අරගලය කිරීමේ, බෙදහද ගැනීමේ, උත්සව පැවැත්වීමේ පමණක් නොව වේදනා විඳීමේ සියලු කටයුතු වල හේතුව හා වැදගත්කම ගම මත රැඳී පැවතිණ. නියත වචනවලින් කියතොත් – ඇදහිලි යාතිකා දෙස් දෙවොල් වල සිට නිෂ්පාදන ශ්‍රමයේ දෛනික වැඩ කටයුතු දක්වා සියලු මානව හැඟීම් ප්‍රකාශනයන්ට ගමේ සීමිත පරිපාලන රටාව තුළ ඒකාබද්ධ ස්ථානයක් තිබුණේය. සත්‍ය වශයෙන්ම බලය ජනතාව තුළ හෝ ඔවුන්ට ආසන්න ස්ථානයක තිබිණි.

මේ ලක්ෂණ දැන් බොහෝ සෙයින් වෙන්වී ගොසිණ. දැන් සියල්ල ගම වෙත ගලා එන්නේ නගරයෙනි. නාගරික ජීවන රටාවෙනි. දැන් ජනතාව කයින් ජීවත් වන හිස් ස්ථානයක පමණි.

**ජනතාවගේ නිර්මාණ ශක්තිය ප්‍රකාශ කිරීම හා උචිත තාක්ෂණය අතර සබඳතාවයක් තිබේද ? එය නැවතත් ජනතාවගේ සාමූහික ක්‍රියාකාරිත්වය හැකියාව මතුකරන්නක්ද? ස්ටීවන් වොයිවිටා** මෙසේ දක්වයි අදහස්: ''ජනතාවට සාකච්ඡා කිරීමට හා එමගින් තීරණ ගැනීමට හැකි ස්ථානයක් ලෙස පොදු නිවාසයක් අපි සකස් කර ඇත්තෙමු. එම නිවසේදී සාකච්ඡා කළ ඔව්හු මෙතෙක් තිබුන නායකයා අනුව යැමේ පිළිවෙත ඉවත් කළයුතු යැයි තීරණය කළහ. දැන් එහි නායකයෙක් ඇත''.

**පොදු නිවසේ ජනතාව තීරණය ගන්නේ කුමන ආකාරයෙන්ද? ග්‍රාමීය ප්‍රජාතන්ත්‍රවාදය එහි තිබේද? එය ක්‍රියාත්මක වන්නේ කෙසේද?** එක් වැඩමුළුවකදී සිය නම ප්‍රකාශ කිරීමට අකමැති වූ සහභාගිවන්නෙ සිය සිතැඟි හෙළිකළේ මෙසේය: ''සභාපතිකෙනෙකු සිටිනවාට මා කැමති නෑ. මා පැමිණියේ හැමදෙනාටම කතා කළ හැකි ශමකින් අපේ ගමේ අය කතා කරන්නේ කුමක්ද කියා දන්නවා''.

ලෝකයේ අනෙක් ප්‍රදේශවල සුළු ග්‍රාමීය ජනතාව සමඟ වැඩ කර අත්දැකීම් ඇත්තෙක්මි. බොහෝ සෙයින් ඔවුන්ගේ ස්වභාවයද මෙයමය. **ග්‍රාමීය ප්‍රජාතන්ත්‍රවාදය යනු සභාපතිවරයෙක් හා නියෝජිතයන් තෝරා න්‍යාය පත්‍රයක් අනුව වැඩ කරන ක්‍රියාදමයකට වඩා සරල එකකැයි පෙනේ. ජනතාව – මිනිස්සු – එක්ව පැමිණ ප්‍රශ්න සාකච්ඡා කරති. කළයුත්ත කුමක්දැයි තේරුම් ගැනීම නායකයාගේ දක්ෂතාවයයි.** ''අපි අද අර වැඩ කරමුයි'' ඔහු ක්‍රියාවලිය යෝජනා කරයි. තත්වය පිළිබඳ ඔහුගේ තේරුම් ගැනීම හා ඔහුගේ යෝජනාව නිවැරදි නම් ජනතාව එය අනුමත කර ඔහු පසුපස එති. එසේ නුවහොත්; ඇත්තෙන්ම කිසවෙක් ඔහු පසුපසින් නොඑන අතර, එම වැරැද්ද, නැවතත් කළහොත් ඔහු නායකයෙකු ලෙස කිසිවෙකු පිළිගන්නේ නැත. මේ තීරණ ගන්නා ඉතා දක්ෂ සමාජ ආයතනයකි. ග්‍රාමීය ප්‍රජාවගේ පැවැත්ම පැත්තෙන් ගත් මෙය අතිශයින් අගනේය. එය සාමාන්‍ය මිනිසාට ඉහළින් අවහිරතා ඇතිකෙරෙන බල ව්‍යුහයක් ඇතිවීමට ඉඩනොදේ. මගේ අත්දැකීම නම් ජනතාව සාමූහිකව කටයුතු කිරීමේ අතිශය ක්‍රියාකාරී ක්‍රමය සොයාගත් බවයි. එහෙත් ප්‍රශ්නය නම් උචිතත ාක්ෂණය ඔවුන්ගේ ජීවිතවලට කෙසේ ගැලපෙනවාද යන්නයි.

නව සංවර්ධනයන් බොහොමයක් මගින් ජනතාවගේ ජීවන රටාව වෙනස් කර ඇති බවට සැකයක් නැති අතර ජනතාව ඒ ගැන සැළකිල්ලෙන් සිටිති. ඔව්හු කණගාටුවෙති.

සමාජ සංවිධාන හා ජීවන රටාවන් ගමේ සංවර්ධනයට බාධාවක් යැයි සිතීම සම්පූර්ණයෙන් වැරදිය. නොඑසේම, එමගින් සංවර්ධන කටයුතු වලට මිළ කළ නොහැකි අගනා ආරම්භක ස්ථානයක් සපයා දෙයි.

එහෙත් ඒ සමග අප විසින් තේරුම් ගතයුතු කරුණ නම්, නව අදහසක් අප හඳුන්වා දෙන විට තමන්ගේ පැරණි අදහස් වැරදිය. අඥනය, හා අසම්පූර්ණය යන හැඟීමක් ජනතාව තුළ ඇති වන බවය, එයින් තමන් නොදියුණු යැයි කෙනෙකු කී විට ඇතිවෙන්නාක් මෙන් හිත් රිදීමක් ඇතිවිය හැකිය. එක් රාත්‍රී සාකච්ඡාවකදී සිය ගම ගැන සංවර්ධනයෙක් මෙසේ කීයේය. ''අලුත් ව්‍යාපාර මම ආරම්භ කරන්නේ සෙමෙන්. ජනතාව වැරදි ලෙස සිතනවායැයි ඔවුන්ට හැඟීමක් දී හිත රිදවීමට මට අවශ්‍ය නෑ''.

උචිත තාක්ෂණය ජනතාවගේ ජීවන තත්වය වෙනස් කරන්නේ නම් එය ජනතාව අතර පතුරු වන්නේ කෙසේද? ගමේ ව්‍යාප්ති සේවකයාට උචිත මඟක් තිබේද? පැරණි රාජ්‍ය තන්ත්‍රයේ සේවකයෙකු සංවර්ධන සේවයෙකුමෙලස පත් කිරීමෙන්ද? ජනතාව සාමූහිකව යමක් කිරීමට පෙර ඔවුන් සාමූහිකත්වයට පැමිණිය යුතුය. එසේ නම් උචිත තාක්ෂණ සංකල්පය ජනතාවගේ සාමූහිකත්වය වඩවන එකක්ද? නැතහොත් එය විශාල සංවර්ධන ක්‍රියාවලියක එක් කොටසක් පමණක්ද? සාමූහිකව වැඩ කිරීම යනු ක්‍රියාවලියක ප්‍රතිඵල ලැබීමට වඩා ගැඹුරුය. ක්‍රියාවලියේ සතුටත්, නිර්මාණාත්මක ප්‍රකාශනයත් ගායනයත් එයට ඇතුළත්ය.

**ජනතාවගේ සාමූහිකත්වයේදී ගායනා හා උත්සව කොතරම් විශිෂ්ට සේවාවක් කරන්නේද යනු අපි තේරුම් ගත යුතුවෙමු. ගැමි ඇදහිල්ලේ සිට පොදු නිවාසය දක්වා දිවෙන සංවර්ධන මාර්ගයක් තිබේද? උචිත තාක්ෂණය යනු බලකාමී සමස්ත සංවර්ධන චින්තනයක කොටසක් විය යුතුද ? නැතහොත් ජනතාවගේ සිතුම් පැතුම් හා රුචි වර්ණයන් අනුව සකස්කර නිවසේ ඔවුන්ට සුදුසු ස්ථානයක ජනතාව තබා ගන්නා දෙයක්ද? සමහර උචිත තාක්ෂණයන් ගොරහැඩි නම් එය ප්‍රිය ජනක කිරීමක් ප්‍රශ්නයක් නොවන්නේද?**